**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2015**

-----------------------------------------------------------------------

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 06 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍ර මාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී නිවාස ආධාර ලබාදීම සඳහා සුපිරි වාසනා ලොතරැයියෙන් සභාව වෙත ලබාදී තිබූ මුදලින් ඉතිරිවී තිබූ රු.18,906,285 ක් සහ ආබාධිත තැනැත්තන් සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ මුදලින් ඉතිරිව තිබූ රු.568,782 ක් තැන්පතු වශයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අතිරික්තය රු.19,475,067 කින් වැඩියෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,449,836 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.747,803 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,702,033 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් වියදම් රු.23,988,766 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් අරමුණු අතුරින් පහත කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදිය හැකි සේවා සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම, ආබාධවලට ප්‍රධාන හේතු දැනගැනීම හා ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම, ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සළසා අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම, ඔවුන් වෙනුවෙන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම යනාදී කාර්යයන් ඉටුකරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබූ කර්තව්‍යයන් 07 ඉටුකිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේදී ආබාධිත සිසුන් 120 ක් වෙනුවෙන් ආධාර ලබාදීමට සැළසුම්කර ඒ සඳහා රු. 8,837,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණ ද ඉන් රු.1,779,320 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක ප්‍රමාණයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.8,494,483 ක් වෛද්‍ය ආධාර ලෙස ගෙවීම් කර තිබුණද වෛද්‍ය ආධාර ඉල්ලුම් කරන ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර ප්‍රතිලාභීන් පිළිබඳව පසු විපරම් ක්‍රියාවලියක් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඇස්කණ්නාඩි 5,000 ක් බෙදාදීමට සැළසුම් කර තිබුණද, වටිනාකම රු.52,650 ක් වූ ඇස්කණ්නාඩි 81 ක් පමණක් මිලදී ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී එම කණ්නාඩි බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අඩු ආදායම්ලාභී නිවාස නොමැති ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන යටතේ ආබාධිත පුද්ගලයන් 300 කට නිවාස ආධාර ලබාදීමට රු.85,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් රු.43,000,000 ක් පමණක් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආබාධිත තැනැත්තන් 267 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.31,110,356 ක් පමණක් වැයකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී නිවාස ආධාර ලබාදීමට ලැබුණු මුදලින් වර්ෂය අවසානයට රු.17,999,656 ක් එනම් සියයට 27 ක් ඉතිරිවී තිබුණි. කෙසේ වුවද වර්ෂය අවසාන වනවිට පළවන, දෙවන හා තුන්වන වාරිකයන් ගෙවීමට ඇති ආබාධිත තැනැත්තන් පිළිවෙළින් 114 ක්, 296 ක් සහ 401 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

අඩු ආදායම්ලාභී ආබාධිත සිසුන්ට මාසිකව රු.750 ක ප්‍රවාහන දීමනාවක් ලබාදීමට භාණ්ඩාගාර ලේකම් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සුදුසුකම් ලත් ආබාධිත සිසුන් 10,502 ක් හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී ආබාධිත සිසුන් 4,706 ක් සඳහා පමණක් මාස දෙකක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 26 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 15 ක් විය. ඒ අනුව තනතුරු 11 ක පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු පැවතීම හේතුවෙන් පනතින් පවරන ලද බොහෝ කර්තව්‍යයන් ඉටු කිරීමට අපොහොසත් වීමට ඉන් බාධාවක් නොවේය යන්න විගණනයේදී බැහැර කල නොහැකි විය.

# 5. ගිණුම්කටයුතුභාවය

----------------------

## 5.1 අයවැය පාලනය

------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර ඒ අනුව මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැය භාවිතා කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

**------------------------------**

2012 ඔක්තෝබර් 12 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ පහත සඳහන් නියෝග සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබූ අවස්ථා පහත දැක්වේ.

| කාරක සභා නියෝග අංකය | නියෝගය |
|---|---|
| 05 | ආබාධිත පුද්ගලයන්ගේ මහ ලේකම් කාර්යාලය විසින් නීතිපති වෙත ඉදිරිපත් කරන ලද ආබාධිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව පිළියෙල කර ඇද්ද යන්න අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම . |
| 06 | රට තුල ජීවත් වන ආබාධිත පුද්ගලයන්ගේ මෑත කාලීන තොරතුරු පිළිබඳ දත්ත බැංකුවක් පවත්වා ගෙන යාමට අදාළ ක්‍රියාදාමය පිළිබඳ වාර්තාවක් කමිටුව වෙත ලබා දීම . |
| 08 | ආබාධිතයන් සඳහා වූ පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමට ඇති හැකියාව සොයා බැලීම පිළිබඳ පහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම .<br><br>(අ) ආබාධිත පුද්ගලයන්ට විශේෂ අධ්‍යාපන පහසුකම් ලබා දීම සඳහා දිවයින පුරා පාසල් 25 ක් ඇති කිරීම,<br><br>(ආ) මෙම පාසල් තුළ සංවර්ධනය කළයුතු පහසුකම් ඇති කිරීම.<br><br>(ඇ) ගුරුවරුන් පුහුණු කිරීම.<br><br>(ඈ) ගුරුවරුන්ට ස්ථිර පත් වීම් ලබාදීමේ හැකියාව පිළිබඳ සොයාබැලීම හා<br><br>(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මෙම පාසල් ලියාපදිංචි කිරීමේ වැදගත්කම. |

**6. පද්ධති හා පාලනයන්**

**------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
| --- | --- | --- |
| (අ) ගිණුම්කරණය | | ආධාර නිසිලෙස ගිණුම්ගත නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | | නිසි පරිදි කාර්ය මණ්ඩල ඇබෑර්තු නොපිරවීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | (I) | සුදුසුකම්ලත් ආබාධිත පුද්ගලයන්ට නිසි පරිදි ආධාර නොලැබීම. |
| | (II) | ආධාර ලේඛන නඩත්තු නොකිරීම. |